# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 737 – 1992 ඔක්තෝබර් 16 වැනි සිකුරාදා - 1992.10.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය --- | - | තනතුරු - ඇබෑර්තු --- --- | 1352 |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය --- | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය --- --- | - |
| වෙනත් පත්කිරීම් ආදිය --- --- | - | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් --- --- | 1354 |
| පළාත් සභා නිවේදන --- --- | 1336 | බඩුබාහිරාදිය විකිණීම් --- --- | - |
| පළාත් සභා විවිධ දැන්වීම් --- --- | - | තොටුපළල්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් --- | - |
| | | විවිධ දැන්වීම් --- | - |


සැ. යු. – (I) මාතර අහදියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සහ අත්තිඩිය මන්ත්‍රීමුල්ල ශ්‍රී ධර්මාශෝක විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 1992 අප්‍රේල් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

(ii) දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත, 1992 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා ප්‍රවෘත්ති කලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සහ පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 1992 මැයි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1992 අංක 9 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත, 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත, 1992 මාර්තු මස 06 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළකරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරණු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරණු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළකරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම් වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 1992 ඔක්තෝබර් මස 23 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1992 ඔක්තෝබර් මස 09 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙනසේ එවිය යුතුය.

1992 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# පළාත් සභා නිවේදන

යොමු අංකය - සීඑම්/බී/03/03

## සබරගමුව පළාත් සභාව

වැටුප් සහ දීමනා ගෙවීම (සංශෝධන) කෙටුම්පත් ප්‍රඥප්තිය

මෙහි පහත පළකරන වැටුප් සහ දීමනා ගෙවීම (සංශෝධන) කෙටුම්පත් ප්‍රඥප්තිය මෙම ගැසට් පත්‍රයේ පළකරන දිනයේ සිට දින දහයක් ඉකුත්වීමෙන් පසු සබරගමුව පළාතේ පළාත් සභාව ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධි විධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු ඇත්නම් ඒවා එම දින දහයේ කාල සීමාව තුළ මා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

අබේරත්න බණ්ඩාර හේරත් පිලපිටිය,
ප්‍රධාන අමාත්‍ය,
සබරගමුව පළාත් සභාව.

**පළාත් සභා (වැටුප් සහ දීමනා ගෙවීම) ප්‍රඥප්තිය (සංශෝධන) අංක 1992**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

02. මෙම ප්‍රඥප්තිය 1992 අංක 1 දරණ පළාත් සභා (වැටුප් සහ දීමනා ගෙවීම) ප්‍රඥප්තිය (සංශෝධිත) යනුවෙන් හඳුන්වනු ලැබේ.

1989 අංක 02 දරණ පළාත් සභා (වැටුප් සහ දීමනා ගෙවීම) ප්‍රඥප්තිය පහත සදහන් පරිදි සංශෝධනය කරණු ලැබේ :-

(1) 2 වැනි වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සදහන් වගන්තිය ආදේශ කරණු ලැබේ :-

(2) 1992.06.01 වැනි දින සිට හා ඉන්පසුව -

(අ) සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප හා දිමනාව වශයෙන් රුපියල් පන්දහසක් (රු. 5,000) ද,

(ආ) සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික වැටුප සහ දිමනා වශයෙන් රුපියල් හාරදහසක් (රු. 4,000) ද,

ගෙවිය යුත්තේය.

10 - 134

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 08 දරණ සබරගමුව පළාතේ ව්‍යාපාර නාම පිළිබද ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රෙගුලාසි හා නියෝග**

1992 ජුලි මස 10 වැනි දිනැති අංක 723 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (ආ) වැනි කොටසේ පළකරන ලද 1990 අංක 08 දරණ සබරගමුව පළාතේ ව්‍යාපාර නාම පිළිබද ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රෙගුලාසි හා නියෝග යටතේවූ 2 වැනි ශීර්ෂය යටතේ ඇති (7) වැනි වගන්තිය " සබරගමුව පළාතේ කැගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් නියෝජ්‍ය ව්‍යාපාර නාම රෙස්ට්‍රාර්වරුන් ලෙස හා කර්මාන්ත ප්‍රවාහන හා වෙළද අමාත්‍යාංශයේ ජ්‍යොෂ්ඨ සහකාර ලේකම්, අතිරේක ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් " ලෙස පත්කෙරේ.

එච්. ආර්. ජයතිලක පොඩිනිලමේ,
කර්මාන්ත ප්‍රවාහන හා වෙළද අමාත්‍ය

රත්නපුර සබරගමුව පළාත් සභාවේ,
කර්මාන්ත ප්‍රවාහන හා වෙළද අමාත්‍යාංශයේදිය.

10-273

---

මගේ අංකය : මපස/ජ/12/90(xii)

**මධ්‍යම පළාත් සභාව**

මතු දැක්වෙන ප්‍රඥප්තිය 1991 ක් වූ නොවැම්බර් මස 26 වැනි දින මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේදී ඒකමතිකව සභා සම්මතවූ අතර, අංක ජීසීපී/ඒඑස්/3 හා 1992 ක්වූ ජනවාරි මස 08 වැනි දින දරණ ලිපියෙන් එයට මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ජී. ආර්. රණසිංහ
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1992 ක්වූ අගෝස්තු මස 17 වැනි දින,
මධ්‍යම පළාත් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 92,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 වර්ෂයේ අංක 14 දරණ සමුපකාර සේවක කොමිෂන් ප්‍රඥප්තිය

**මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් ඇති කිරිම සදහා ද, මධ්‍යම පළාත් සමුපකාර සමිති සේවකයින් සදහා විශේෂ විධි විධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධවූ හා ආනුසාංගික කරුණු සදහා විධි විධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත් සභාවේ 1990 වර්ෂයේ අංක 14 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්විය හැකි අතර, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට මෙය වලංගුවේ.

ලුහුඬු නාමය සහ වලංගු දිනය

02. ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරණු ලබන ආඥාවකින් :-

සමුපකාර සමිති මේ ප්‍රඥප්තියේ මතුවට එන විධි විධාන වලින් නිදහස් කිරීම පිළිබඳ ඇමතිවරයා සතු බලතල

(අ) එහි නිශ්චිතව සඳහන් කරණු ලැබිය යුතු යම් සමුපකාර සමිති පන්තියක් හෝ,
(ආ) එසේ නිශ්චිතව සඳහන් කරණු ලැබිය යුතු යම් සමුපකාර සමිතියක්,

මේ ප්‍රඥප්තියේ මතුවට එන විධි විධාන වලින් නිදහස් කළ හැකි අතර, ඒ අනුව " සමුපකාර සමිතිය " යන යෙදුම් ඒ විධි විධාන වල යෙදෙන කවර ස්ථානයක වුව ද එවැනි ආඥාවක් තත්කාලයෙහි වලංගුව බලනොපවත්නා සමුපකාර සමිතියක් බව එයින් අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතුයි.

1 වැනි කොටස

03. මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මධ්‍යම පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන හා දන්නා අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය.

සමුපකාර කොමිෂන් සභාව පිහිටුවීම

04. (1) මේ වගන්තියේ මතුවට එන විධි විධාන අනුව කොමිෂන් සභාව සංයුක්ත විය යුතුය.

කොමිෂමේ සංයුතිය

(2) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් පත්කරණු ලබන තුන්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතුය.

(3) යම් තැනැත්තෙකු -

(අ) සමුපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයකු නම් : හෝ
(ආ) ඇමතිවරයාගේ මතය අනුව, සමුපකාර සමිති විසින් සේවයෙහි යොදවා ගනු ලබන යම් වර්ගයකට අයත් තැනැත්තන්ගේ වැටුප, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීම අරමුණ වශයෙන් ඇති හෝ අරමුණු වලින් එකක්ව ඇති යම් කාර්ය මාණ්ඩලික සංගමයක හෝ වෘත්තිය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු නම් ; හෝ
(ඇ) සමුපකාර සමිති පිළිබඳ නිතිය අනුව සමුපකාර සමිතියක නිලධාරියෙකුව සිටින තැනැත්තෙකු නම් ; හෝ
(ඈ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක්ව හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක්ව සිටින තැනැත්තෙක් නම් ; හෝ

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම නුසුදුසු විය යුතුය.

05. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවන් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නිතිගත සංස්ථා තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරණු ලැබීම කළ හැකි විය යුතුය.

කොමිෂන් සභාව නිතිගත සංස්ථාවක් විය යුතු බව

06. කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයා තම පත්වීමේ දින සිට අවුරුදු තුනක කාල සීමාවක් දූරය දැරිය යුතුය.

සාමාජිකයන්ගේ ධූර කාලය

එසේ වුව ද එවැනි පත්වීමක දූර කාලය ගැන නොතකා -

(අ) එවැනි සාමාජිකයෙකු විසින් යම් අවස්ථාවක තම දූරයෙන් ඉල්ලා අස්වීම හෝ ඇමතිවරයා විසින් ඔහු ධූරයෙන් ඉවත් කිරීම කළ හැකිය. තව ද ,
(ආ) එවැනි යම් සාමාජිකයෙකු 4 (3) වැනි වගන්තිය අනුව නුසුදුසු වීමෙන් පසු ඒ හේතුවෙන්ම සිය ධූරය හිස් කළ යුතුය.

එසේම තව දුරටත්, එවැනි යම් සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරණු ලැබීමෙන් හෝ ධූරය හිස්කිරීමෙන් ඇති වන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරණු ලබන යම් තැනැත්තෙකු විසින් තමා පත්කරණු ලැබුවේ යම් සාමාජිකයෙකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කොටසට සමාන කාලයක් මුත් ඊට වැඩි කාලයක් ඒ ධූරය නොදැරිය යුතුය.

07. (01) ඇමතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් කෙනෙකු එහි සභාපති වශයෙන් පත්කළ යුතුය. සභාපති පැමිණ සිටින අවස්ථා වලදි කොමිෂන් සභාවේ සියළුම රැස්වීම් වලදී ඔහු මූලාසනය දැරිය යුතුය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපති පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයන් දෙදෙනා එකඟත්වය ඇතිව ඔවුන් අතුරින් එක් අයෙකු විසින් මූලාසනය දැරිය යුතුය.

කොමිෂමේ සභාපති සහ එහි කටයුතු පවත්වා ගෙන යාම

(02) කොමිෂන් සභාවේ රැස්වීමකට ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතුය.

(03) කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සාමාජිකයන් දෙදෙනෙකු පමණක් පැමිණ සිටියහොත් හා යම් ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් කළ යුතු තීරණය පිළිබඳව සාමාජිකයන් අතර, මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනාම පැමිණ සිටින රැස්වීමක් වෙත යොමු කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනාම පැමිණ සිටින යම් රැස්වීමකදී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දිය යුතු තීරණය පිළිබඳව කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර, මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්නය පැමින සිටින සාමාජිකයන් වැඩි දෙනාගේ මතය අනුව තීරණය කල යුතුය. එහෙත් සාමාජිකයන් සමානව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පනවනු ලැබූ යම් නියෝගයක විධි විධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්යය පරිපාටිය විධිමත්ව කළ හැකිය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර, පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යක් අවලංගු නොවිය යුතුය.

**සාමාජිකයන්ට ගෙවීම**

08. කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයින්ට පළාතේ මූල්‍ය විෂයය භාර පළාත් අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව ඇමතිවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් හා දීමනා ගෙවිය යුතුය.

**ලේකම් සහ සෙසු නිලධාරින්**

09. (1) කොමිෂන් සභාවේ ලේකම්වරයෙකු විය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතුය.

(2) කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයෙහි සෙසු සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයෙන් පත්කරණු ලැබිය යුතුය.

**කොමිෂමේ සාමාජිකයන් සහ නිලධාරින් දිවුරුම් දීම**

10. (1) කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උප ලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහිවූ දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කළ යුතුය.

(2) කොමිෂන් සභාවේ ලේකම් විසින් හා දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කළ යුතු යැයි කොමිෂන් සභාවේ සභාපති විසින් නියම කළ හැකි කොමිෂන් සභා සෙසු නිලධරයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උප ලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහිවූ දිවුරුමක් හෝ සහතික ප්‍රකාහයක් කළ යුතුය.

**කොමිෂන් සභාව සතු බලතල**

11. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුයි -

(අ) සමුපකාර සමිති වල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රම වලට අදාළ සියළු කරුණු හා ඔවුන්ගේ සේවා කොන්දේසි ද පත්කිරීමේදී හා සමුපකාර සමිතියක හෝ එක් තනතුරකින් ඒ සමිතියේම තවත් තනතුරකට උසස් කිරීමේදී සමිති විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරිම.

(ආ) සමුපකාර සමිති වල සේවකයින් බඳවා ගැනිම සඳහා විභාග පැවැත්වීම හෝ ඒ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල පත්කිරීම හා විභාග වලට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය කිරිම.

(ඇ) එවැනි යම් තනතුරකට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරිම, යම් පන්තියක හෝ එවැනි යම් තනතුරකට හෝ තනතුරු වලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රමය නියම කිරීම, කොමසාරිස් විමසා ඒ වැටුප් ක්‍රම කලින් කළ ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමුපකාර සේවකයින්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමේදී කොමිෂන් සභාවට සහය වීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සැළකිය හැකි උපදේශක කාර්යය සංවිධාන පිහිටු වීම.

(ඈ) යම් පන්තියක් හෝ වර්ගයක් යම් තනතුරක් හෝ තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙස සමුපකාර සමිති වලට නියම කිරීම.

(ඉ) තම සේවකයින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමෙහිලා යම් සමුපකාර සමිතියක් විසින් අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය හෝ කාර්යය පරිපාටි නිශ්චය කිරීම සේවකයින්ට විරුද්ධව විනයානුකූල පරීක්ෂන කොමිෂන් සභාව විසින් නියම කරණු ලබන කාලයක් ඇතුලතදී අවසාන කරන ලෙස ද සමුපකාර සමිතියකට නියම කිරීම හා යම් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ නයානුකූල නියෝගයකට විරුද්ධව පැන නගින ආයාචනා විභාග කිරීම.

(ඊ) යම් සමුපකාර සමිතියකට එහි සේවකයින්ට අදාල නියමිත සටහන් තබන ලෙස නියම කිරීම.

(උ) යම් සමුපකාර සමිතියක යම් සේවකයකු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපි ගොනු, වෙනත් ලේඛන හෝ තොරතුරු නිශ්චිතව නියමිත දිනයකට පෙර සපයන ලෙසත්, ඒ සමිතියට කියා සිටීම.

(ඌ) කොමිෂන් සභාව විසින් යොමු කරණු ලබන ආයාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තා කිරිම පිණිස නිලධරයන්ගෙන් සමන්විත මූල මණ්ඩලයක් හෝ මූල මණ්ඩල පත්කිරිම.

(එ) යම් සමුපකාර සමිතියක සේවකයෙකුගේ ක්‍රියා කලාපය පරීක්ෂණයකට විෂයවී තිබීම හේතුවෙන් ඒ සේවකයා විසින් සමිතියේ තීරණයකට විරුද්ධව කොමිෂන් සභාව වෙත ආයාචනාකර ඇති අවස්ථාවක ඔහු නැවත සේවයට ගැනීම පිළිබඳව උපදෙස් ඇතුළුව ඒ සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ක්‍රියාත්මක කරන ලෙසට ඒ සමුපකාර සමිතියට නියම කිරීම.

(ඒ) සේවකයන්ගේ සේවය අවසන් වීමේදි පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුනට ප්‍රදාන කළ හැක්කේ යම් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුව ද ඒ ප්‍රතිපත්ති නියම කිරීම.

(ඔ) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් යම් සමුපකාර සමිතියක් හෝ යම් පන්තියක සමුපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් විමසා ඇමතිවරයාට උපදෙස් දීම හා,

(ඕ) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ගැසට් පත්‍රයෙහි පළකරණු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පවරණු ලැබිය හැකි සමුපකාර සමිති වලට හා ඒවායේ සේවකයින්ට අදාල වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(2) (1) වැනි උප වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරුණු බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්චය කිරීම්, අමුතු කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ ඉවත දැමීම කොමිෂන් සභාව විසින් කළ හැකිය.

මූල්‍ය ප්‍රතිපාදන

12. කොමිෂන් සභාවේ වියදම් වාර්ෂිකව පළාත් සභාව විසින් ඒ සඳහා ප්‍රතිපාදන කරණු ලබන මුදල් වලින් ගෙවිය යුතුය.

## 2 වැනි කොටස

සමුපකාර සමිතිය සේවා යෝජක ලෙස සැලකීම

13. යම් සේවකයෙකුගේ වැටුප හා වෙනත් පඩිනඩි සමිතියේ මුදල් වලින් තත්කාලයෙහි ගෙවන සමුපකාර සමිතියක් ඒ සේවකයාගේ සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතුය.

සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ විධි විධාන වලට යටත් විය යුතු බව

14. සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුව ද මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරණු ලැබිය හැකි විධාන වලට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා බලතල ඉටුකිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහිලා කෙරෙන කොමිෂන් සභාවේ සියළු තීරණ 11 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව අවසානාත්මක විය යුතුවක් හැර ඇමතිවරයා විසින් 2 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් නිදහස් නොකරන ලද සියළු සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ විධි විධාන පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

සමුපකාර සමිති සේවක කොමිෂන් සභාවේ විධාන පිළිපැදීමට බැඳී සිටින බව

15. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරණු ලබන සියළු විධාන 11 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ විධාන ඒ සමිතිය විසින් කරන ලද්දක් මෙන් ඒ සේවකයා ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

16. (1) ශ්‍රී ලංකාවේ 1972 වර්ෂයේ අංක 02 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ආඥා පනතේ වලංගුව පවතින සේවා නියමයන් හා කොන්දේසි සමුපකාර පළාත් කොමිෂන් සභාවේම සේවා නියමයන් හා කොන්දේසි සම්මතකර පනවන යම් කාලයක් දක්වා වලංගුව පවතිනු ඇත.

සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීම පිළිබද මනාපය පළකිරීම

(2) සමුපකාර සමිති වල දැනට සේවයේ යෙදී සිටින සෑම සේවකයෙකුටම ඔහු කැමැත්තේ නම් ඔහු පත්වීම ලැබූ අවස්ථාවේදී ඔහුට අදාලව පනවා තිබූ සේවා නියමයන් හා කොන්දේසි යටතේ තව දුරටත් සේවයේ රැඳී සිටීමේ මනාපය පළකළ හැකිය.

(3) පත්වීම ලැබූ අවස්ථාවේදී තමාට අදාළවූ සේවා නියමයන් හා කොන්දේසි යටතේ තව දුරටත් සේවයේ රැඳී සිටීමට මනාපය පළකරණු ලබන සෑම සේවකයෙක්ම, තම සේවා නියමයන් හා කොන්දේසි පැනවීමෙන් පසු යම් විටකදී පිරිනැමෙන උසස් වීමක් පිළිගතහොත් මෙම කොමිෂන් සභාව මගින් නියම කරණු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීම අවශ්‍ය වනු ඇත.

(4) කොමිෂන් සභාව විසින් නියම කරණු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගනිමින් මේ වගන්තිය යටතේ කරණු ලබන සියළු තෝරාගැනීම් අවලංගු නොකළ හැකි විය යුතුය.

සිටින නිලධාරින් සේවා යෝග්‍යතා පරීක්ෂා කිරීම සහ අලුත් සේවා කොන්දේසි නියම කිරීම

17. (1) සේවකයකු දරන තනතුර දැරීමට ඔහුගේ සර්ථභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයකින් හෝ අන් ආකාරයකින් කොමිෂන් සභාව සෑහීමට පත්කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය අනුව යම් සේවකයෙකුට නියම කළ හැකිය. එසේ වුව ද කොමිෂන් සභාව විසින් නියම කරණු ලැබිය හැකි යම් වර්ගයක හෝ වර්ගවල සේවකයන්ට පමණක් මේ උප වගන්තියෙහි ඉහත දැක්වුනු විධි විධාන අදාළ විය යුතුය.

(2) (1) වැනි උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා ඒ තනතුර දැරීමට තමාගේ සර්ථභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමකට පත්කිරීමට අපොහොසත් වන අවස්ථාවක කොමිෂන් සභාවේ මතය අනුව ඔහුගේ හැකියාවකට ගැලපෙන තනතුරක ඔහුගේ කැමැත්ත අනුව ඔහු යෙදීමට කොමිෂන් සභාව උත්සහ කළ යුතු අතර, ඒ ප්‍රතියෝජනය සිදුනොකෙරුණහොත් එකල ඔහුට අදාළවූ සේවා නියමයන් හා කොන්දේසි අනුව හෝ එවැනි නියමයන් නොපවත්නා අවස්ථාවක යුක්තිසහගත කල්දීමක් කිරීමෙන් පසු ඔහු සේවයේ යෙදී සිටි සමුපකාර සමිතිය විසින් ඔහුගේ සේවය අවසන් කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය පරිදි නියම කළ හැකිය.

(3) (1) වැනි උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා කොමිෂන් සභාව විසින් නියම කරණු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීමට තෝරා ගන්නා අවස්ථාවක (1) වැනි උප වගන්තියේ විධි විධාන අනුව ඔහු විසින් කොමිෂන් සභාව සෑහීමකට පත්කරතහොත් මිස හා එසේ කරන තුරු ඒ සේවා නියමයන් හා කොන්දේසි වලට ඔහුට හිමිකම් නොතිබිය යුතුය.

පදිංචිය පිලිබඳ සුදුසුකම්

18. (1) මධ්‍යම පළාත තුළ යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරක් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක්වත් ඒ දිස්ත්‍රික්කය ඇතුළත පදිංචිව නොසිටි යම් තැනැත්තෙකු පත්නොකළ යුතුය.

(2) එසේ වුව ද කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයෙක් එම දිස්ත්‍රික්කය තුළ නොමැති නම්, පළාත තුළ පිහිටි අනිකුත් දිස්ත්‍රික්ක වල අයදුම්කරුවන්ගෙන් සුදුසු පුද්ගලයෙක් එම තනතුර පිරවීම සඳහා පත්කිරීමට එම සමිතියට අවසර දීමට කොමිෂන් සභාවට හැකිය.

සේවක වැටුප් පරිමාණය සමිති වර්ගය අනුව නිශ්චය කිරීම

19. සමුපකාර සමිතියක තනතුරකට පත්කරණු ලැබූ යම් තැනැත්තෙකුට ඒ සමිතියේ වර්ගය අනුව සහ 29 (1) වැනි වගන්තිය යටතේ නිශ්චය කරන සේවකයන්ගේ වර්ග හා පංති අනුව ඒ තනතුරට අදාළ වැටුප් ක්‍රමය දිය හැකිය.

රජයේ සේවකයින් ද්විතිය කිරීම

20. මේ ප්‍රඥප්තියේ අනිකුත් විධි විධාන කිසිවක් ගැන නොතකා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ද, අදාළ පුද්ගලයාගේ සහ සමුපකාර සමිතියේ ද, කැමැත්ත ඇතිව ඒ සේවා නියමයන් හා කොන්දේසි මත ඒ කාල පරිච්ඡේදයට හා ඒ කාර්යයට එම සමිතියේ සේවයට ද්විතීය කරණු ලැබූ පළාත් සහා රාජ්‍ය සේවයේ පුද්ගලයෙකු එම සමිතියේ ඕනෑම තනතුරකට පත්කිරීමට කොමිෂන් සභාවට හැකිය.

සමුපකාර සමිති සේවක වැටුප්

21. සෑම සමුපකාර සමිතියක් විසින් එහි මුදල් වලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් ද, වෙනත් දීමනා කිසිවක් වේනොත් ඒ දීමනා ද ගෙවිය යුතුය.

සමුපකාර සමිති සේවක ස්ථාන මාරු

22. (1) සමුපකාර සමිතියත එම සමිතියේ යම් සේවකයෙකු ඒ සමිතියේ එක් සේවා ස්ථානයකින් එහි අන්කිසි සේවා ස්ථානයකට මාරු කිරීමේ බලය තිබිය යුතු අතර, විනය හේතු නොවන යම් හේතුවක් නිසා මාරු කිරිම් කරණු ලබන අවස්ථාවක ඒ මාරු කිරීම් ඒ සේවකයාගේ පඩිනඩි කෙරෙහි හානිකරව බලනොපෑ යුතුය.

(2) ඒ ඒ සේවා යෝජකයාගේ එකගත්වය කලින් ලබා ගෙන ඇතහොත් සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ ඒකාබද්ධ ඉල්ලීමපිට එක් සමුපකාර සමිතියක යම් සේවකයෙකු වෙනත් සමුපකාර සමිතියක සේවකයෙකු වශයෙන් පසුව කී සමුපකාර සමිතියට මාරු කිරිමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතුය.

සේවකයින් සේවයෙන් පහකිරීම සහ දඩුවම් පැමිණවීම

23. මේ ප්‍රඥප්තියේ හෝ එය යටතේ පනවනු ලැබූ නියෝග කිසිවක විධි විධාන අනුව හැර යම් සමුපකාර සමිතියක් විසින් ඒ සමුපකාර සමිතියේ කිසිම සේවකයෙකු පහකිරීම හෝ අන් ආකාරයකින් ඔහුට දඩුවම් කිරිම නොකළ යුතුය.

සමුපකාර සමිති සේවක ඇප

24. (1) කොමිෂන් සභාව විසින් නියම කරණු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයෙකුට නියම නොකළ යුතුය.

(2) සමුපකාර සමිතියක යම් සේවකයෙකු විසින් තබන ලද මුදලක්වූ යම් ඇපයක් සමිතියේ නමින් බැංකුවක තැන්පත් කළ යුතු අතර, එයට අයත් වන යම් පොලියක් ඒ සේවකයාට ගෙවියු යුතුය.

සේවකයින්ට අදාල රෙගුලාසි

25. (1) පහත සඳහන් ආකාරයේ, එනම් -

(අ) සමුපකාර සමිති වල සේවකයන් බඳවා ගැනීම, පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විසින් ඉල්ලා අස්වීම හා ඔවුන්ගේ සේවාවන් අවසන් කිරීම සම්බන්ධයෙන්

(ආ) සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික, අත්තිකාරම් දීම, උසස් කිරීම, නිවාඩු, නිලධරයන්ගේ වැඩ තහනම් කිරීම, පත්වීම අවසාන කිරීම්, සේවයෙන් පහකිරීමට හෝ ඒ සේවකයන්ට අන්කිසි ක්‍රමයක දඩුවම් පැමිණ වීම හා ඊට විරුද්ධව යම් ආයාචනා කිරීම් සම්බන්ධයෙන් විධි විධාන සලස්වමින් හා

(ඇ) ඒ සේවකයන්ගේ සේවා නියමයන්ට හෝ කොන්දේසි වලට අදාල අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් නියෝග පනවනු ලැබිය හැකිය.

2. (1) වැනි උප වගන්තියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම නියෝගයක්ම පිළිපැදිමට සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් බැඳි සිටිය යුතුය.

26. පළාත තුළ ක්‍රියාත්මක වන සෑම සමුපකාර සමිතියක් විසින් -

සේවකයින් සම්බන්ධයෙන් සමුපකාර සමිති වල යුතුකම්

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන් නියම කරණු ලබන නාම ලේඛන හෝ සටහන් තබා පවත්වා ගෙන යායුතු අතර, ඒ එක් එක් සේවකයා සම්බන්ධයෙන් නියම කරණු ලැබිය හැකි සියළු විස්තර එහි සටහන් කළ යුතුය.

(ආ) එහි සේවකයන් සම්බන්ධයෙන් නියම කරණු ලැබිය හැකි වාර වාර්තා හෝ සටහන් හෝ කොමිෂන් සභාවට අවශ්‍යවී සපයන ලෙස කලින් කළ නියම කළ හැකි තොරතුරු කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය.
තව ද,

(ඇ) සමිතියේ කාර්යාල වලින් යම් කාර්යාලයකට ඇතුළුවී එහි තබා ගෙන යනු ලබන පොත්, ගණන් සටහන් හෝ වෙනත් ලේඛණ කිසිවක් පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට බලය පවරණු ලැබූ කොමිෂන් සභාවේ යම් සේවකයෙකුට හෝ සාමාජිකයෙකුට එසේ කිරීමට ඉඩ දිය යුතුය.

*අර්ථ සාධක අරමුදල*

27. සේවා යෝජකයෙකුවූ සෑම සමුපකාර සමිතියක්ම හා ඒ සමිතියේ සෑම සේවකයෙකුම විසින් නිතියෙන් නියම කරණු ලැබිය හැකි යම් මුදලක් වාර පතා දායක මුදල් වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුය.

*සමුපකාර සේවකයින් කොමිෂන් සභාවේ නව සමිතියේ සේවකයන් බව*

28. සේවය ගන්නා ලද්දේ මෙම ප්‍රඥප්තිය පනවනු ලබන දිනයට පෙර වුව ද, පසුව වුව ද සියළු සේවකයන් ඔවුන් සේවය ගන්නා ලද්දේ යම් සමිතියක් විසින් ද ඒ සමිතියේ සේවකයන් බව, ඒ සමිතියේ සේවයෙහි නියුක්ත බව හා ඒ සමිතියට පක්ෂපාත විය යුතු බව සැක දුරුවීම පිණිස මෙයින් ප්‍රකාශ කරණු ලැබේ.

3 වැනි කොටස

*කොමසාරිස් විසින් සමිති වර්ග කළ යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළ යුතු බව*

29. (1) සමුපකාර සමිති වල තනතුරු සඳහා වැටුප් ක්‍රම නියම කිරීමේ කාර්යය සඳහා එක් එක් සමුපකාර සමිති වර්ග කිරීමේදී යම් සමුපකාර සමිතියක සේවකයන්ගේ වර්ග හා පන්ති සහ ඒ එක් එක් වර්ගයේ හා පන්තියේ විය යුතු සේවකයින්ගේ ගණන නිශ්චය කිරීමේදි තමා සුදුසු යැයි සළකන අන්දමින් කලින් කල එය වෙනස් කිරීමේ බලය කොමසාරිස්ට තිබිය යුතුය.

(2) I වැනි උප වගන්තිය යටතේ කොමසාරිස් විසින් කරණු ලබන නිශ්චය කිරිම කඩ කරමින් කිසිම සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට නොගත යුතුය.

*සුදුසකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකගත්වය ලබා ගත යුතුය.*

30. කොමිෂන් සභාව විසින් සමුපකාර සමිති වල යම් තනතුරකට පත්කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ද, යම් පන්තියක හෝ යම් වර්ගයක යම් තනතුරකට හෝ තනතුරු වලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රම නියම කිරීම ද, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධන කිරිම ද, කොමසාරිස්ගේ එකගත්වය ඇතිව කළ යුතුය.

4 වැනි කොටස

*දුෂ්කරතා ඉවත් කිරිම*

31. මෙම ප්‍රඥප්තිය විධි විධාන ක්‍රියාත්මක කිරීමෙහිදී මේ ප්‍රඥප්තියේ කිසිම විධි විධානයක් හෝ සාර්ථක විධි විධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවක් උද්ගත වුවහොත් ඇමතිවරයා විසින් ආඥාවක් මගින් ඒ සැකය ඉවත් කළ හැකිය. එවැනි සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පළකළ යුතු අතර, එසේ කරණු ලැබීමෙන් පසු එයට නීතිමය බලය තිබිය යුතුවාක් හැර මෙහිලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතුය.

*කොමිෂන් සභාව විසින් නියෝග පැනවිය හැකි බව*

32. (1) ප්‍රකාශිතවම අන් ආකාරයක විධි විධාන සලස්වන ලද්දේ නම් මිස නියෝග පැනවීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියමකර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ද ඒ සියළු කරුණු සහ නියම කළ යුතු මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශකර හෝ නියමකර ඇති සියළු කරුණු සඳහාවූ නියෝග ඇතුළුව, මෙම පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති එලගැන්වීම සඳහා අවශ්‍ය බව කොමිෂන් සභාවට පෙනීයා හැකි සියළු නියෝග කොමිෂන් සභාව විසින් පැනවිය හැකිය.

(2) එවැනි කිසිම නියෝගයක් ඇමතිවරයා විසින් එය අනුමත කරණු ලබනතුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකරණු ලබනතුරු බල නොපැවැත්විය යුතුය.

(3) යම් නිවේදනයක් (2) වැනි උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළකරණු ලැබූ විට ඒ නිවේදනය අදාළවන නියෝගය එය මෙහිලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතුය.

*කොමිෂන් සභාවේ සාමාජික පුද්ගලයන්ගේ නිදහස*

33. කොමිෂන් සභාවේ යම් සාමාජික පුද්ගලයෙකු විසින් ඒ සාමාජිකයා වශයෙන් හෝ නිතිගත සංස්ථා තත්ත්වයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තිරණයක් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජික පුද්ගලයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ සිවිල් හෝ අපරාධ අන්කිසි කෘත්‍යයක් පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතුය.

*ගිවිසුම්ගත හෝ අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයින් සේවයේ යෙදවීම*

34. මේ ප්‍රඥප්තියේවිධි විධාන ගැන නොතකා සමුපකාර සමිතියක් විසින් එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයේ දියුණුව පිණිස :-

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ගිවිසුම් පදනමක් පිට යම් නිශ්චිත කාලයකට ප්‍රවිනයෙකුගේ හෝ විශේෂඥයෙකුගේ සේවය ලබා ගත හැකිය. නැතහොත්,

(ආ) අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයන් හෝ කැලි මිම්මේ පදනම පිට ගෙවන සේවකයින් සේවයෙහි යොදවා ගත හැකිය.

එසේ වුව ද කොමිෂන් සභාවේ එකගත්වය නොමැතිව එවැනි සේවකයන්ට තනතුරේ කිසිම ස්ථිර සේවයක් නොදිය යුතුය.

*වැරදි*

35. (1) (අ) මෙම පනතේ විධි විධාන කඩකරන ; හෝ

(ආ) කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන යම් ක්‍රියාවක හෝ මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමිෂන් සභාව හෝ යථා පරිදි බලය පවරණු ලැබූ අන් තැනැත්තෙකු, සපයන ලෙස නියම කරන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(ඇ) ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන යම් සමුපකාර සමිතියක් හෝ එහි යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරු විය යුතුය.

(2) (1) වැනි වගන්තියෙහි සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක්ම හෝ සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරණු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේවූ යම් වරදක් සමුපකාර සමිතියක් විසින් කරණු ලැබූව අවස්ථාවක ඒ සමිතියේ සෑම නිලධාරියෙකුම ඒ වරදකර ඇත්තේ තම දැනුම නොමැතිව බව හෝ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියළු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පුකර ගතහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සළකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයට ගැනීම නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව සමුපකාර සමිතියක් වරදකරු කරණු ලැබූ විට ඒ සමුපකාර සමිතිය -

(i) (2) වැනි උප වගන්තිය යටතේ එයට නියම කරණු ලැබිය හැකි යම් දඩ දඩුවමකට අතිරේකව ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරණු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වා ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පනහක දඩයක් ගෙවීමට ; හා

(ii) ඒ එක් එක් දඩයෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවාගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමුපකාර සමිතිය වරදකරු කරණු ලැබූ දිනයෙන් අවසන්වූ කාල පරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම් ඔහුගේ සේවය අවසන් කරණු නොලැබ තිබිනි නම් ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය ඒ සේවකයාට ගෙවීමට යටත් විය යුතුය. සමුපකාර සමිතියක් මේ උප වගන්තියේ (ii) ඡේදය යටතේ ගෙවීමට යටත්වන යම් මුදලක් ඒ සමුපකාර සමිතිය වරදකරු කරණු ලැබූ උසාවිය විසින් ඒ සමිතියට නියම කරණු ලැබූ දඩයක් ලෙස ඒ උසාවියේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අයකර ගන්නා මුදල ඒ සේවකයාට ගෙවිය යුතුය.

කොමිෂන් සභාවේ කටයුතු වලට මැදිහත් වීම

36. තම රාජකාරිය කිරීමේදි හැර නියමින් හෝ අනියමින් තමා විසින්ම හෝ අන් තැනැත්තෙකු මාර්ගයෙන් කවර හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ යම් තිරණයක් කෙරෙහි යම් සාමාජිකයෙකු කෙරෙහි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත්කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේසත්‍රාත්වරයෙකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරණු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කරණු ලැබීමට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව

37. කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයෙකු, කොමිෂන් සභාවේ ලේකම්, කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන්කවර තැනැත්තෙකු විසින් වුව ද තම නිළ කාර්යයන් කිරීමෙහිලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටුකිරීමේදී තමාට දැන ගන්නට ලැබෙන කවර හෝ ලේඛනයක්, සංදේශයක් හෝ තොරතුරක් පළකිරීම හෝ අන්තැනැත්තකුට එළිදරව් කිරීම නොකළ යුතුය.

කොමිෂන් සභාවේ සංදේශ වරප්‍රසාද යුක්ත බව

38. කොමිෂන් සභාව හෝ යම් සාමාජිකයෙකු හෝ නිලධරයෙකු හා යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමුපකාර සමිතියේ පාලන කාරක සභාවේ යම් සාමාජිකයෙකු හෝ එහි නිලධරයෙකු හා අතර, හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයෙකු හා අතර, කොමිෂන් සභාවේ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් කිරීමෙහිලා හෝ ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් හුවමාරුවූ ලිඛිත හෝ වාචික යම් සංදේශයක් යම් නිති කෘත්‍යයකදි ඉදිරිපත් කරන ලෙස එළිදරව් කරන ලෙස එසේ ඉදිරිපත් කිරීමට හෝ එළිදරව් කිරීමට සභාපති ලියවිල්ලකින් කැමැත්ත දෙතහොත් මිස කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතුය. නැතහොත් බල නොකළ යුතුය.

ඇතැම් ප්‍රඥප්ති සමුපකාර සමිති වලට හා ඒවායේ සේවකයන්ට අදාළ නොවිය යුතු බව
(3) අධිකාරිය

39.. කොමිෂන් සභාවට හෝ එය සම්බන්ධයෙන් හෝ සේවා යෝජකයෙකු වශයෙන් යම් සමුපකාර සමිතියකට හෝ එය සම්බන්ධයෙන් හෝ යම් සමුපකාර සමිතියක සේවයෙහි නියුක්ත නම් සේවකයෙකු සම්බන්ධයෙන් හෝ කාර්මික ආරාවුල් පනතේ කිසිවක් අදාළ නොවිය යුතුය. නැතහොත් එසේ අදාළ වන ලෙස තේරුම් ගැනීම හෝ සැළකීම නොකළ යුතුය.

පද සම්බන්ධය

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි " කොමිෂන් සභාව " යනුවෙන් මධ්‍යම පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස්වේ.

"කොමසාරිස් " යන්නෙන් මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අදහස්වේ.

"සමුපකාර සමිති " යන්නෙන් සමුපකාර සමිති වලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන සමිතියක් බව අදහස් කෙරේ.

"සේවකයා " යන්නෙන් මෙම පනතේ අරුථානුකූලව සමුපකාර සමිතියක සේවකයෙක් යන්නත් අදහස්වේ.

"නියම කරණු ලබන " යන්නෙන් කොමිෂන් සභාව විසින් පනවන ලද නියෝග වලින් නියමිත බව අදහස්වේ.

"දිස්ත්‍රික්කය " යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් තුළ පිහිටි දිස්ත්‍රික්කයන්වේ.

" අමාත්‍යවරයා " යන්නෙන් මේ පනත යටතේ මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ යුතුකම් ඉටුකිරීම සඳහා පත්කරන ලද තැනැත්තා වශයෙන් අදහස් කෙරේ.

මෙම ප්‍රඥප්තිය අවබෝධයෙහි ව්‍යාකූල තත්ත්වයක්වේ නම් ඉංග්‍රීසි අනුවාදයේ සංනිවේදනය, අදහස හා තේරුම බලපානු ලැබේ.

**කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය**

................................ වන මම සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත්කිරීම හේතු කොටගෙන මධ්‍යම පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති / සාමාජික වශයෙන් එම තනතුරේ කටයුතු අපක්ෂපාතිව, භීතියකින්, හිතවත්කමකින් හෝ ද්වේශයකින් තොරව ඉටුකරන බවත්, එසේ කිරීමේදී මීට අයත් කිසිම කරුණක් ගැන කිසිම දෙයක්, රාජකාරියට විනා වෙනත් පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවත්, මෙයින් ගරු ගාම්භීර පූර්වකවත් අවංකවත් දිවිරා ප්‍රකාශකර සිටිමි / ප්‍රතිඥා දෙමි.

1991 ක් වූ ..................... මස ................... වැනි දින මා ඉදිරියේදී / දිවිරා ප්‍රකාශ කරන ලදී / ප්‍රතිඥා දෙන ලදී.

..........................................

මහාධිකරණයේ විනිශ්චයකාරතුමා

**කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය**

................................ වන මම මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් / නිලධාරියෙකු වශයෙන් රාජකාරි කටයුතු ඉටුකිරීමට නියම වීම කරන කොටගෙන එම ලේකම් / නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ඉටුකිරීමේදී රාජකාරියට අදාලව විනා, වෙනත් කවර විටකදී හෝ මාගේ රාජකාරී කටයුතු වලදී දැන ගන්නට ලැබෙන කිසිම ලියවිල්ලක, සංදේශයක හෝ තොරතුරක අඩංගු කවර ආකාරයක හෝ කරුණක් හෝ එහි කොටසක් කිසිම පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවට මෙයින් ගරු ගාම්භීර පූර්වකව / දිවිරා ප්‍රකාශකර සිටිමි / ප්‍රතිඥා දෙමි.

1991 ක් වූ ..................... මස ................... වැනි දින මා ඉදිරියේදී / දිවිරා ප්‍රකාශ කරන ලදී / ප්‍රතිඥා දෙන ලදී.

..........................................

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති